*Vidyodaya J., Soc., Sc., Vol. 3, January-July, 1989, pp. 167-176.*

# වන්දනා කවි

ලංකාරාමය, මිහින්තලය, අත්තනගල්ල, දඹුල්ල සහ සමනළ

(බ්‍රිතාන්‍ය (කෞතුකාගාර) පුස්තකාලයේ තැන්පත් ව ඇති පුස්කොළ පිටපත් ඇසුරෙන් සකස් කරන ලදී)

කැලණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ

**එම්. ඩබ්ලිව්. විමල් විජේරත්න**

1. ස ත ර  පෝය පේවී ඉද සිල්  රකිනේ[1]
නොහැර  පැවති චෛත්‍යවල් ඇවිද  වනේ
අ හ ර  දැහැත් තෙල් මල් නිසි ලෙස  රැගෙනේ
වෙ හෙ ර  ඇවිද වඳිමුව නොහැර සත්  දිනේ[2]

2. අලන්  කාර ලෙස වැඩ පළමු ව  රාමේ
ගලින්  කරපු දේ බොහො කල්  පැවතීමේ
උළින්  වසා තිබුණා පළමු ව  රාමේ
මලින්  පුද වඳිමුව  ලංකාරාමේ

3. අ ත්  නොහැරෙයි මතු සිදු වන පෙරුම්  බලේ
සි ත්  ලොබ වේ ය මුනි සදහම් අසනා  කලේ
මෙත්  බෝසතුන් ළඟ අසමුව දහම්  බලේ
ඇ ත්  කඳ[3] වෙහෙර වැඳ එමු ගොස්  මිහින්තලේ[4]

4. සැණ සැණ  ලෙසින් එයි මරුවා  දූනගල්ලා
තැන තැන  ලෙසින් වත් දන් පින්  කරපල්ලා
දූන දූන[5]  නොකොට[6] දස අකුසල්  ඇරපල්ලා
තැන තැන  පැවති චෛත්‍යවල්  වැඳපල්ලා

5. ඉ ස්  දන් දුන්නු සිරිසඟ රජ  දිළිඳකුට
ප ස්  වා දහස් පවතිනවා එතන  සිට
ගොස්  කළ වෙහෙර ගෝඨාබය රජු  කලට
ගොස්  වැඳ පුදමු අත්තනගලු වෙහෙර  වට[7]

6. වැඩලා  එ රජ එ දවස් දඩයමට  වනේ
රැකලා  මුවකු ලුහුබඳවා එ[8] ගිය  තැනේ
දැක ලා  තෙරිඳු මී අඹ ගස යට  සෙවනේ
සැකලා  කිනම් සිට අවුදු යි  විමසමිනේ

7. ද ම් මා  සෝක නරපති හට[9] පුත්  වෙමිනේ
ස ම් මා  සම්බුදුන් සාසනෙ[10] පැවිදි  වුණේ
පෙම්මා  ලෙසින් තොප හට කරුණා  ලෙසිනේ
දෑ ම් මා  මෙ ලක්දිවු ආවේ  දඹදිවිනේ

8. ඉන් වැඩ පිලියකුටේ පරුවත මුදුන
තුන් යම දහම් ඇසුවේ දෙවියෝ එදින
නින්[11] නැත සතුන් එ දවස් සසරින් මිදුණ
ඉන් සිට නොහැර පැවතී එන මෙ සාසන

9. නිරා දුකට යන මාවත් නොකරල්ලා
ද රා මුනිඳු ගුණ සඳහන් කරපල්ලා
ක රා මීටිය පසුකරගන පලයල්ලා
පු රා පෙරුම් යමු රංගිරි දඹුල්ලා[12]

10. බෝකල කුසල් පල දෙයි මතු දනගල්ලා
ආ ක ල සතට නිසි ලෙස සොඳ සෙ[ව]නැල්ලා
නා ළ ල ගිමන් හැර ලා මං බැසපල්ලා
පේ වි ල වඳිමු[13] ගොස් රංගිරි දඹුල්ලා[14]

11. සි ඳ හැර කෙලෙස් සතුරන් මතු ජය ගල්ලා
වි ඳ දි[ව] ඉසුරු මොක් සිරි දෙයි දනගල්ලා
ඇ ඳ ගල ගිමන් හැර මං බැස පලයල්ලා
වැඳ පුද කරමු ගොස් රංගිරි දඹුල්ලා[14]

12. ලෙනක් සැදුණු ලෙස බලමුව දඹුලු ගලා[15]
ක ල ක් පවතිනා ලෙස එහි වැඩම කලා[16]
හි ණ ක් කර[ා] මෙනි යන මොක් පුරය බලා[17]
මෙලක් දිවට පරසිදු ලෙන දඹුලු ගලා[18]

13. අගිලන් කමින් වැඩ සිටි ලෙසට යමහලේ
ග ලි න් එ බුදු රුව සක් රජ ඇවිත් කළේ
පෙළින් පෙළට එහි කළ බුදු රුව බැබළේ
අ ල න් කාර වැඩ රංගිරි දඹුලු ගලේ

14. අදිමින්[19] පිරිනිවන් පෑ ලෙස සිතියමට
බඳිමින්[20] සඳුන් හර ගෙන දරසැය කොට
වඩි[මි]න් මුනිඳු යමහල දරසැය යට
අඩමින්[21] අනඳ සිරි පා මුල වැතිර සිට

15. ඇඹු ලු[22] අඹේ ගම පසු කර පලයල්ලා
ද ඹු ලු[23] ඔයෙන් නා පිරුවට ඇඳපල්ලා
බැ බ එ නොයෙක් බුදු රුව දැක වැඳපල්ලා[24]
මෙ මු එ ලොවට පරසිදු ලෙන දඹුල්ලා[25]

16. ඇ ති කර සාසන[26] මතු පවතින්ට වැඩ ම කලේ
රු ති කර බලාවත් නැරෙයි සිතු ආලේ
පෙති රුව දහස් ගණනක් ඇඳ[27] එහි බැබළේ
සි ති යම බලමු[28] වැඩ රංගිරි දඹුලු ගලේ[29]

17. එ වෙ නි සතිය ගෙවමින් මුනිඳුන් එවිට
මෙවෙනි යුදෙන් ජය සිරි ලත් බෝදියට
එ වෙ නි තුමන් නෙත් පුද කර සත් දිනට
දෙ වෙ නි සතිය ගෙවමින් ඒ තැන්[හි] සිට

18. ඉන් වැඩ ගුවන් කුස යට මුනි සක්මනට
පින් බල පාපු[30] රහ දෙවියෝ දැක සතුට
දුන් මුනිඳුන්ට එ රුවින් සක්මනක් කොට
තුන් වන[31] සතිය ගෙවමින් එ සක්මන පිට[32]

19. සි වූ වර දෙවිඳු මුනි අදහස් දැක සතොසින්
මැවූ මුනිඳුන්ට වැඩ සිටිනට ගෙයි එ රුවන්
ස වූ සත රකිම් මතු පවතිනු ලෙස අදිටන්
සි වූ වෙනි සතිය බැලුවේ ගබඩාව දහන්

20. මහ සුප් තෙරිඳු ගිනි ගේ වට අඩන විට
දහ සක් දුහුල් පට රන් දෙණ විවර කොට
මහ සුප් තෙරිඳු සිරි පා දැක වැඳල සිට
දහ සක් ගුණෙන් ඉස්තුති කර බුදු ගුණට

21. මා ර යුදය දෙරකඩ සිතියම ඇන්ද
දු ර පිඹුරු[33] දිවි වග වලසුන් ඇන්ද
ගෝර විසැති උරගුන්[34] එහි දරමින්ද
පා ර මිතා බල පෑ[35] සැටියට ඇන්ද

22. මෙ සේ පෙරුම් බල පෑ මර සෙන් බිඳුනේ
වි සේ සයෙන් බුදු සිරි දැක දෙවි එදිනේ
බෝසේ සතුටුවෙන් සැණකෙළියට සැදුනේ
මෙ සේ පළ[මු] සති බෝ මැඩ එ ආසනේ

23. අ ත් හැරියේ කරදර[36] පවු දුරින් දුර
ප ත් කෙරුවේ දසවිද පෙරුමන් නොහැර
මෙත් කෙරුවේ සැම ලොව සවු සත නොහැර
ස ත් සතියේ සිතියම පිළිවෙළ නොහැර

24. වග වල ගවරු දිවි ගජ වන සතුරු කැලා
මහ තොට ඇසුරු බැරි ගල් සෙල් ඇළ ගඟුලා
සඟ වැඩි රහත් ලකුණක් ඇති යමුව[37] බලා
ගඟ දිග යමුව සමනළ ගිරි කුළය බලා

25. හැ ර මිටිපාණ පසු කර ගඟ එ ගිය තැනා
පෙර සිට දෙඩන්බැවිලත් පැවතී එ තනා
දු ර සිට බලා යමු සමනළ කුළ පෙනෙනා
පු ර වක පෝය වඳිමුව සමනළ ගොසිනා

26. ගොස් මරහනෝ බුදු බලයෙහි රහ නොදැනේ
රැ ස් කර රුවන් මිණි බරණින් සැරසෙමිනේ
වි ස් තර ගීතිකා කෙළිනළුව ම සැදුනේ
ප ස් වන සතිය වැඩ අජපල් නුග සෙවනේ

27. දෙවෙනි එයින් වැඩලා මිදෙල් ගස යට
එ වෙ නි වසින වැසි දැක නා රජු එවිට
මෙවෙනි තුමන් වැඩ සිටුවා දරණ පිට
ස වෙ නි සතිය මුචලිඳු ගේ පෙණය යට

28. අත් කර නිවන් දෙන සඳ මුනි වැඩම කොට
සිත් තොස වෙමින් වෙළඳුන් දෙදෙනා එවිට
පත් කර නිවන් මී[38] පිඩු දන් දී සතුට
සත් වන සතිය වැඩ කිරි පළු ගස යටට

29. අහස් පොළව සැම දෙවියන් ගේ වරමින්
දහස් සුවාසූ දස දරුමේ[39] බලයෙන්
රහත් පසේ බුදු සැම මුනිවර සරණින්
පහස් වේය සැම දෝසය එ[40] බුදු අණින්

30. පවු දුරු කරන ලෙස සත හට මෙත් කරති
සවු සත රකින ලෙස මොක් පුර මං සදති
සිවු වර දෙවිඳු සෙත් ගෙන දීලා රකිති
ගවු තම මුනිඳු[41] අණයෙන් වස් දුරුව යෙති

31. ගොතා කියමි මුනි ගුණ සදහම් නැරේ
සි තා ගනිමු[42] මෙත් කරුණා සතුන් කෙරේ
ප තා ගනිමු උපදින ලෙස තුසිත පුරේ
ඉ තා මියුරු සැපතට යමු නිවන් පුරේ

32. ගමන් විඩා ඇත ගල් සෙල් කඳුරැල්ලා
ගිමන් නිවමු රුප් පෙරෙවුනු ඇවිල්ලා
විමන් සොයා මතු යන ලෙස මෙ සියල්ලා
සමන් කුළේ වැඳ සිත් සනසා ගල්ලා

33. මස් කෙ ළි යේ ගඟ එතර ව මං බසිමු
ගොස් හිමයේ[43] ගෙවමින් මළුවට බසිමු
නෙත් පිරියේ[44] රට තොට සැම තැන බලමු
සිත් පි රි යේ සමනළ සිරි පා වඳිමු

34. කු නු දිය ඇල්ල පරුවත මළුවට දකුණේ
පෙනු නිය බැණ සමනළ කුළ වම කෝණේ
ය නු බැරි දිවා ලෙන සත් හිරු[45] නැගෙන කොණේ
මු නි තැබු පාද පත්මේ උතුරට නැමුණේ

35. අ මා නිවන් සැප දෙන මුනි සුගතාවන්
පෙමා වඩන එ මුනි දේසනාවන්
නි මා සසර ගෙවූ මුනි සාවකාවන්
මෙමා උපනුපන්[46] තැන වාසනාවන්

36. සුගත් මුනි දතු චෛතිය[47] සංදේසේ
රුගත් සුගත සදහම් මතු පද බෝසේ
උගත් ඇසූ ජන සිත් මන පොලඹන සේ[48]
නගත් නරන් දෙවු මොක් පුර යන වේසේ[49]

37. මෙක් බෝ සතුන් සමඟ ම නර ලොවට එමු
නෙත් පිරි සිතින් එ මුනි බුදු සිරි[50] බලමු
සි ත් පිරි තොසින් විසිතුරු දරුමේ[51] අසමු
ප ත් කර නිවන් මුනි සාසන පැවිදි[52] වෙමු

38. මුනි සරණේ ගුණ සිත තොර නොවේ වන්[53]
ගුණ වරුණේ එ මුනී දේසනා වන්
මන පුරනේ ඇසූ සත සිත් පිනා වන්
තුනුරුවනේ[54] ගුණ මතු වාසනා වන්

39. පෙමා වඩන මුනි ගුණ දේසනා වන්
මෙමා සිතේ හැම විට පින පිනා වන්
නිමා සසර කළ පවු දුර දමා වන්
අමා මහ නිවන් මතු වාසනා වන්

40. සාර සංකෙට පළමු බුදු[55] වූ එ දීපංකර මුනි[56] බලේ
ගෝර සසරේ කිමිද ඇවිදින් මෙ අප බෝසත් එම කලේ
නෑර සිදු වන ලෙසින් බුදු බව එ බෝසත් පෙරුමන්[57] බලේ
පාර මං බැස එ මුනි වඩිනට එද බෝසත් එලි කළේ

41. එලා දිවිසම ගෝරු මඩ පිට [එද] ජීවිත පුද කළේ
බලා මතු බුදුවන්ට පෙරුමන් එද විවරණ ලැබූ කලේ
බලා වැඩලා සමන් මල් ගෙන පුද ඒ මුනි වැඩි කලේ
සලා දමු මල් ගොඩේ වැඩ සිට දස පෙරුම් අදිටන් කළේ[58]

42. එද මහ බඹු අතට බිහි වී එ සත් පියවර වැඩි කලේ
එද තුන් ලොව වෙවුලුවා සිට දෙතිස් මහ පූජා කළේ
එද තුන් ලොව දිවස් බලමින් එ බෝසත් සිහ[59] නද කළේ
එද මිහිකත තැබූ සිරි පා වඳිම් බැතියෙන් සමනළේ

43. එතැන් සිට සූවිසි මුනිඳු ගෙන් නොහැර ලැබ විවරණ බලේ
සතුන්[60] සසරින් මුද මොක් පුර හරින ලෙස කරුණා කළේ
පැතුන් බල මතු නොහැර අඹු දරු ඉස් මස් ලේ පුද කළේ
මෙතුන් ලොව සැම සතුන් හරිනට නිවන් මාවත් එලි කළේ

44. යසින් යස රජ ඉසුරු සිරි[61] විඳ එ බෝසත් වැජඹෙන කලේ
තොසින් සිත් කලකිරී සසරට එ සිරි සැප ලොබ නොම කළේ
ගොසින් පැවිදි ව නිවන් යන මග සොයන ලෙස අදිටන් බලේ
උසින් ගිරි කුළ එ මුනි සිරි[62]පා වඳිම් බැතියෙන් සමනළේ

45. වන්න නම් ඒ ඇමති කැඳවා එ බෝසත් වඩිනා කලේ
කන්ත නම් අස්වයා සදමින් ගෙනත් මුනිඳුට ළං කළේ
පන්න වා අසු එ ගං තෙර දී පැවිදි සුව ලත් පින් බලේ
වැන්න සත මොක් පුරට යන මං වඳිම් සිරිපා[62] සමනළේ

46. බලා සිදුහත් කුමරු පිය රජ එද දෙහොතට වැඩි කලේ
කාල දේවල[63] තාපසින් ගේ නළල සිරි පා තිල කළේ
ආල ලෙස බැලූ දෙතිස් මහ බුදු ලකුණු දැකලා සිතු ලොලේ
ආල කර ගොස් වඳිමු එතුමන් එබූ[64] සිරි[62] පා සමනළේ

47. වැඩෙන එ කුමරු පුන් සඳක් සේ සොළොස් හැවිරිදි වූ කලේ
ලොබින සිවු සැට සිල්ප දක්වා ලොවට පෙරහැර[65] පෑ කලේ
සොඳින[66] බිම්බා[67] නම් බිසවු බෝසතුට අග මෙහෙසුන් කළේ
වඳින ලෙස යමු එ මුනි සිරි[62] පා එබූ සමනළ ගිරි කුළේ

48. පු ර න මුනි දස පෙරුම් සිදු කරවන්ට බෝ මැඩ වැඩි කලේ
රැගෙන මර සෙන් සඳ[68] වසවතු එද යුදයට ආ කලේ
උ ර න වීලා කිපි වසවතු[69] මුනිඳුන්ට යුදයට ආ කලේ
ස ර ණ එතුමන් රැගෙන වදිමුව එබූ සිරි[62] පා සමනලේ[70]

49. එද අදිටන් බලෙන් මුනි බුදුවන්ට බෝ මැඩ වැඩි කලේ
සද මර සෙන් රැගෙන වසවතු එද යුදයට ආ කලේ
එද මුනි දස පෙරුම් බල පෑ[71] එ දස බිම්බර දුරු කළේ
පුද වදිමුව සුගත් සිරි[62] පා වදිම් බැතියෙන් සමනළේ

50. වැ ඩි ය බෝසත් එද අජපල් සෙවන යට බැස උන් කලේ
ලොබිය පින් බල එද කිරි පිඩු සුජාතා දන් දුන් කලේ
වැ ඩි ය පිළිගෙන එ කිරි පිඩු දන් එද ගං තෙර වැලි තලේ
වැ ඩි ය පින් බල එ මුනි සිරි[62] පා වදිම් සමනළ ගිරි කුළේ

51. වැ ලි ත ලේ මුනිතුමන් වැඩ සිට එ කිරි පිඩු වැළඳූ කලේ
ඇ රි ක ලේ රංතලිය උඩු ගං බලා හැරුනයි ගඟ ජලේ
පෙර කලේ මුනිතුමන් ඇරි රංතලිය ගැසි සිට නද කළේ
ගි රි කු ළේ මුනි තැබූ සිරි[72] පා වදිම් බැතියෙන් සමනළේ

52. පාරමීන් සිදුකර එර්දිවන එ මුනි ජය සිරි[73] බෝ මුලේ
රු ව න් සක්මන් මවා පෑ දෙව් මුනිඳු අදහස් දුටු කලේ
ගු ව න් කුස පැන යමා පෙළහර එ සත් දින මුනි පෑ කලේ
නි ව න් සිදු කර වදිමු සිරි[62] පා එබූ සමනළ ගිරි[74] කුළේ

53. සවන් යොමු කර අසවු අපෙ මුනි ගුණ දහම් සිතු ලොබ කළේ
නිවන් දෙර හැර සතුන් මොක් පුර හරින ලෙස කරුණා කළේ
රුවන් ගෙයි සද්දිනක් සදහම් බලන ලෙස අදිටන් කළේ
එවන් මුනි සඳ එබූ සිරි[62] පා වදිම් බැතියෙන් සමනළේ

54. මා ර දේවි පුත් එද අසි[75] දනු කොන්ත[76] තෝමර ගත් කලේ
නෑ ර ම[ර] සෙන් රැගෙන සෙණ හඬ දෙමින්[77] බෝ මැඩ වට කළේ[78]
ගෝර විසගොර නා පොළොන් ළෙහි පැළඳ ආ යක් සෙන් බලේ
පා ර මී බල පෑපු මුනි රජ වදිම්[79] සිරි පා සමනළේ

55. පෙර කලේ පෙරුමන් බලේ වැඩ උන් කලේ අදිටන් කළේ
පු ර බලේ ගෙන ආ කලේ මරු දුරු කලේ මුනිනේ බලේ
තිර[80] කළේ තුන් ලෝ තලේ දෙව් මුනි බලේ සැණකෙළි කළේ
පෙර කලේ තැබූ ගිරි කුළේ සිරි පා ගලේ වඳු සමනළේ

56. එද පස්වග මහණු උදෙසා ඉසිපතන මුනි වැඩි කලේ
මුද සත මොක් පුරට හැරියේ[81] දෙසූ මුනි සදහම් බලේ
එද මිහිකත ගුගුරමින් ලොව දෙතිස් මහ පූජා කළේ
පුද තෙල් මල් සුගත් සිරි[62] පා වදිම් සමනළ ගිරි කුළේ

57. දිවස් බලමින් මුනිඳු ලක්දිව තුන් වරට වඩිනා කලේ
මෙ ලක්දිව සැම දෙවිඳු එ දවස් නොයෙක් ලෙස පෙරහැර කළේ
දවස් තුන්සිය සැටක් ගිය කල දෙළොස් මස් අවුරුදු පලේ
වෙසක් මස පසළොස්වකින් ගොස්[82] වදිම් සිරි[62] පා සමනළේ

58. නැවත ඉන් වැඩ එද අජපල් සෙවන [මුනි] වැඩ උන් කලේ
සද මී පිඩු දෙබෑ වෙළඳුන් එද මුනිඳුට පුද කළේ
පුවත කර දුන් ලොවට බුදු බල එද පෙරහැර පෑ කලේ
නිවන සත දුක් වදිමු එතුමන් එබූ සිරි[62] පා සමනලේ

59. එද කිරිපළු සෙවන පස්වන සතිය මුනි වැඩ උන් කලේ
සද මී පිඩු දෙබෑ වෙළඳුන් එද මුනිඳුට පුද කළේ
එද සිවුවර දෙවිඳු පා ගෙන[83] මවා පුද කළ පින් බලේ
එද පුද ලත් සුගත් සිරි[62] පා වදිම් බැතියෙන් සමනලේ

60. පා ර වන ගිරි කුළන් ඇළ දෙල [විසල්] ගල් සෙල් හිම තුලේ
ගෝර වස ගොර නා පොළොන්[84] ගජ ගවර දිවි සතුරෝ තලේ
නෑ ර පෙර සිට දෙඩන්බැවිලත් පැවත එන අදිටන් බලේ
පා ර නුමුලා නිවන් යන ලෙස වදිම් සිරි[62] පා සමනලේ

61. රහත් පිරිවර සමග වැඩලා අහස් කුස දිලෙනා කලේ
ද හ ස් ගණනක් සසර සයුරෙන් එද මොක් පුර වන් කලේ
මහත් කොට කම්පාවෙමින් හිම කුළන් අහසට නැගී කලේ
පහ ස් කොට තැබූ සුගත් සිරි[62] පා වදිම් සමනළ ගිරි කුළේ

62. ගු ව න් කුස තුන් පියවරින් දෙවු ලොවට මුනි වඩිනා කලේ
රුවන් මෙර ගුගුරා නැමී සිට එ[85] සිරි පා පිළිගත් කලේ
නිවන් සිදුකර දෙවි බඹුන් හට අබිදහම් වදහළ කලේ
එ ව න් මුනි රජ එබූ සිරි[62] පා වදිම් බැතියෙන් සමනලේ

63. ව ඩි න කල මුනිතුමන් සිරිලක පෙරගමන් දෙවියෝ කළේ
ලොබින[86] ලෙස දෙවි එද සැණ කෙළි රුවන් වැසි වරුසා කළේ
ඔ බි න ලෙස පිරිවර පිහිටි හිම ගිරි කුළන් වටකර දිලේ
ව දි න ලෙස යමු නිවන් දැක්මට එබූ සිරි[62] පා සමනලේ

64. මු නි ඳු සාසන මෙ ලක්දිව පවතිනා ලෙස අදිටන් කළේ
දෙ වි ඳු සුරපති කැඳවමින් මුනි මේ සස්න බාරය කළේ[87]
මි හි ඳු තෙරිඳුන් මෙ ලක්දිව වැඩ තුමන් සාසන ඇති කළේ
පැවිදි[88] ලැබ මෙත්තුමන් සාසන නිවන් වැඳ යමු සමනලේ

65. බැඳී පස්කම් රසේ ලොව සත මුද හැර සදහම් බලේ
මි දී සසරින් නිවන් පුර යන ලෙසින් සවු සත මෙත් කළේ
සැ දී හිම කුළු[89] සපිරිවර ඇත එ වෙනි පරුවත වට දිලේ
දි දී වදිමුව සාදුකාරය තැබූ සිරි[62] පා සමනලේ

66. පාට තද තෙද ඉර සඳක් සේ රත්නයෙන් සැදි නිකසලේ
බූත වැසි වැස යොදුන් ගන පොද අහස දක්වා මහ ජලේ
වාත සුළඟින් දහස් මෙර ගල් ඉගිල අහසට ගිය කලේ
ඊට මැතින් නිවන් දැක්මට වදිම් සිරි[62] පා සමනලේ

67. අ ත් නොහැර දස කුසල් දන් පින් ගත් මුනි සරණ හැම කලේ
මෙත් සිතින් ඉඳ සැම සතුන් හට ජේව[90] රකිමුව පින් බලේ
යෙත් සතුන් මතු නිවන් පුරයට මෙත්තුමන් බුදු වන කලේ
සි ත් ලොබින් ගොස් වදිමු සිරි පා එබූ සමනළ ගිරි කුළේ

## අධෝලිපි පාඨාන්තර

1. රකිගෙනේ AB.
2. සන්දනේ AB.
3. °කඳ B.
4. සට. මිහින්තලයෙහි වූ ඇත් වෙහෙරක් ගැන සඳහන් ය. බලන්න: E.Z. Vol. I. pp. 44, 45, 52, 53, 85, 87.
5. දන දන B.
6. නොකට A.
7. වෙහෙරට A.
8. [ඵ] A.
9. නරපොතිහට B.
10. සාසනයෙහි AB.
11. නිම A.
12. රංග්‍රි දඹුල්ලා B.
13. වදිමුව AB.
14. දඹුල්ලා B.
15. °ගල A.
16. °කල A.
17. බල A.
18. °ගල A.
19. අදි°B.
20. බදි°B.
21. අඩ°B.
22. ඇඹුළු B.
23. දඹුළු B.
24. [වැද]°A.
25. දඹුල්ලා B.
26. සට. සස්න වෙ. (?) පිටපත්හි.
27. ඇද B.
28. බලවූ A.
29. දඹුළු°B.
30. පැසු B.
31. දුන් B.
32. °[පිට]°A.
33. බිඹුරු B.
34. උරඟුන් A.
35. °පා A.
36. කැර °B.
37. යමව AB.
38. [මී] A.
39. [දස] ධර්මය A.
40. [ඵ] A.
41. මුනිඳුගේ AB.
42. ගතිමු A.
43. සිමයේ AB.
44. නෙත් ප්‍රිය A.
45. සකහිරු B.

46. උපන් A.
47. චෛතිය නම් AB.
48. පොලබිත °AB.
49. සේ සේ A. [සේ] සේ B.
50. ශ්‍රී A.
51. ධර්මේ A.
52. පැවද A.
53. නොවෙන් A.
54. °රුවිනෝ A.
55. බු [දු වූ] A.
56. [මුනි] A.
57. පෙරුන් A.
58. සට. මේ පද්‍යය AB පිටපත් දෙකේ ම එන්නේ 43 පද්‍යය ඇති ස්ථානයේ ය. පළමු වර පිටපත් කිරීමේ දී ලියන්නා ගේ ප්‍රමාද දෝෂයකින් එසේ වී යයි කල්පනා කළ හැකි ය.
59. සිංහ AB.
60. සතු B.
61. [සිරි] A.
62. ශ්‍රී AB.
63. කාලදේවර AB.
64. එබුදු A.
65. සට. පෙළහර වෙ. (?) පිටපත්හි.
66. සොඳින් AB.
67. බම්බා AB.
68. සඳ මරසෙන් රගෙණ AB.
69. වසවතු කිපි AB.
70. මේ පද්‍යයේ දෙවන පාදය, පළමු වන පිටපත් කිරීමේ දී ලියන්නා ගේ ප්‍රමාද දෝෂයකින් මග හැරුණු සේ පෙනේ. ඒ වෙනුවට, පසු කලක දී මෙහි 49 පද්‍යයේ දෙවන පාදය යොදා ගත් බැව් සැලකිය හැකි ය.
71. බලපා A.
72. ශ්‍රී B.
73. °සිරිමා AB.
74. ශ්‍රී B.
75. ඇයි A. ; අයි B.
76. කොතන A; කොනන B.
77. දෙමින් දෙමින් A.
78. වැට°AB.
79. වදිම් බැතියෙන් AB.
80. තිල AB.
81. හැර A; හැරයෙ B.
82 [ගොස්] A.
83. සිවුවරදෙවි විපාගෙන් AB.
84. පොලොන් ගව AB.
85. [එ] A.
86. ලොබින් B.
87. ශාසනය බාරක °A.
88. පැවිද A.
89. තිම්කුළු A.
90. ජේවම A.

## ආශ්‍රිත පුස්කොළ පිටපත් පිළිබඳ විස්තර

මෙම සංස්කරණය සඳහා ආශ්‍රිත පුස්කොළ පිටපත් දෙක බ්‍රිතාන්‍ය (කෞතුකාගාර) පුස්තකාලයේ තැන්පත් ව ඇති ඒවා වේ. එකී පුස්තකාලයේ මෙම පුස්කොළ පිටපත්වලට දී ඇති අංක පළමු වන් සමාන ලකුණෙන් පසු, එකී පිටපත් මේ සංස්කරණයේ දී හැඳින්වුණු සංකේතත් දක්වෙයි.

1. or 6604 (241) = A.

පත් ඉරුවක දිග සෙ. මී. 44.05. පළල සෙ. මී. 04කි. පිටුවක පේළි ගණන 04කි. මෙම වන්දනා කවිවලට අමතර ව මෙහි සොළොස්මස්ථාන වන්දනා කවි ද මැටි යාගය ද ඇතුළත් ය. මෙම පද්‍යයෝ මෙහි කෘ-කෞ දක්වා වූ පිටුවල අන්තර්ගත වෙති. ලියූ වර්ෂයක් නො සඳහන් ය. පත් ඉරුවල පෙනුම පරණ නැත.

2. or 6604 (233) = B.

පත් ඉරුවක දිග සෙ. මී. 32.05. පළල සෙ. මී. 05කි. පිටුවක පේළි ගණන 4 - 8 අතර ය. මෙම වන්දනා කවිවලට අමතර ව මෙහි සොළොස්මස්ථාන වන්දනා කවි ද ඇතුළත් ය. මෙම පද්‍යයෝ මෙහි කෘ-බා දක්වා වූ පිටුවල අන්තර්ගත වෙති. ලියූ වර්ෂයක් නො සඳහන් ය. පත් ඉරුවල පෙනුම පරණ ය.